රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 22 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබූ රු 35,155.ක ලද වට්ටම් ගිණුම්ගතකර නොතිබුණි. | වට්ටම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පුස්තකාල පොත් සඳහා ලද වට්ටම් වන රු. 35,155 ක වටිනාකම 2019 වර්ෂයට අදාල අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල දෙකක 2015 හා 2016 වර්ෂවල මුද්දර ගාස්තු දිරිදීමනා පිළිවෙලින් රු. 92,000 ක් හා රු. 41,100 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සෑම වර්ෂයකට මුද්දර ගාස්තු උපලේඛන එවනු ලබන්නේ වසර කිහිපයකට පසුව වන අතර ණයහිමි වෙන් කිරීම අපහසු වී ඇත. එහෙත් ඉදිරි වර්ෂයේදී එසේ ණයහිමි වෙන් කිරීම ආසන්න වශයෙන් හෝ සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තු රු 210,679.ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ගත යුතුවේ. | උපචිත පදනම යටතේ පෙර වර්ෂයට අදාල විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ සිදු වූ වියදමක් ලෙස ගිණුම් ගත කිරීමත් සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු අදාල වර්ෂය තුල වියදමක් ලෙස සලකා ණයහිමි වෙන් කිරීම අඩුපාඩුවක් ලෙස හඳුනා ගන්නා ලදී. |

(ඇ) නොසැසඳුනු ගිණුම්
-----------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>------------------------------------------- |
|---|---|---|---|
| (i) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගිණුම් විෂයන් 05 ක එකතු වටිනාකම රු.115,296,248 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 117,838,619 ක් වූයෙන් රු. 2,542,653 ක වෙනසක් විය. | වෙනස හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විදුලි භාණ්ඩ තොග, පුස්තකාල පොත්, වාහන යන්ත්‍ර සූත්‍රවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා මූල්‍ය ප්‍රකාශන අනුව වෙනස්වීම් හඳුනාගෙන ඇති අතර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට විෂයය භාර නිලධාරින් දැනුවත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.113,750 ක ඖෂධ තොගය පොදු ගබඩා තොගය බවත් දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ශේෂයන් 14 ක එකතු වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු. 195,866,866 ක් හා උපයෝගී ලේඛන අනුව රු. 191,041,889 ක් වූයෙන් රු. 4,824,977 ක වෙනසක් විය. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් හි වටිනාකම් හා ඊට අදාල 14 උපලේඛන අතර පවතින වෙනස්කම් වර්ෂයට අදා ල 2019 සොයා බලා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට රු. 947,227 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂයට අදාලව ගිණුම් සකස් 2019 කිරීමේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඉ) ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(i) ලැබියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 2,278,674 ක් විය. | ලැබියයුතු මුදල් කඩිනමින් රැස්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | රුවන්වැල්ල ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 05 න් දෙකක් සඳහා ප්‍රතිපාදන අප වෙත ලබා දී ඇති අතර, ඉතිරි ප්‍රතිපාදන ඉල්ලුම්කර ඇත. හිඟ මස්, මාළු කඩ කුලී, දඩ හා හිඟ වැසිකිලි ගාස්තු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. හිඟ පොදු වෙළඳපොල කඩ කාමර කුලී හා දඩ රු.152,890 ක් හා වෙළඳපල නොවූ කඩකාමර කුලී රු.502,517 ක් 2019 ජූලි 19 වන දිනට අය කර ගෙන ඇත. ඉතිරිය ගෙවන ලෙස බදුකරුවන් දැනුවත්කර ඇති අතර හිඟ රු. 24,500 ක් වූ බලපත්‍ර ගාස්තු වලින් රු.1,000 ක් අයකර ඇත. |

(ii) ගෙවියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 8,690,445 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ තැන්පත් යටතේ රු.1,168,442 ක මුදලක් මේවනවිට ඉතිරිව ඇත. මෙම මුදල සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කලමණාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 154 වගන්තිය හා 2005 ජූනි 01 දිනැති අංක 2005/04 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | 2010 සිට 2016 දක්වා කට්ටිකර අලෙවි කර තිබුණු අක්කර 41 පර්චස් 24 ක් වූ ඉඩම් කට්ටි 12 කට අදාල සත්‍ය විකුණුම් ම අයකලයුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් කට්ටි ක ඔප්පු විස්තර 03 සොයා ගත නොහැකි වූඅතර ඉඩම් කට්ටි ක ඔප්පු විස්තර ආදායම් 02 පරීක්ෂක වෙත යොමුකර ඉඩම් විකිණීමේ බද්ද නිශ්වය කර ඇත. එක් ඉඩමක මිනින්දෝරු සැලැස්ම අනුමත කර නොමැත. තවත් ඉඩමක වල් බිහි වී ඇති අතර කිසිවෙකු පදිංචි වී නැත. තවත් ඉඩමක අලෙවි වී ඇති ඉඩම් කොටස් පිළිබඳ විස්තර ආදායම් පරීක්ෂකට ලබා දී ඇත. |
| (ii) 158(1) වගන්තිය | 2018 දෙසැම්බර් 31 දින වනවිටත් හිඟව පවතින රු. 976,385 ක් වූ වරිපනම් බදු හා අක්කර බදු සම්බන්ධයෙන් පනත ප්‍රකාරව නීතිමය පියවර ගෙන නොතිබුණි. | නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු හා අක්කර බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන අතර පැරණි වරිපනම් තක්සේරුවේ පැවති දේපල නව වරිපනම් තක්සේරුවේ දී ඉවත් වී ඇති බැවින් එම ඉවත්වූ දේපල වල පවතින හිඟ මුදල් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට ආදායම් පරීක්ෂක මහතුන් වෙත ක්ෂේත්‍ර වාර්තා ලබාදෙන ලෙස පවරා ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 2018 වර්ෂය තුල අවස්ථා 20 ක දී ලබාගත් රු. 303,727 ක අත්තිකාරම් දින 7 සිට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | කාර්යාලයේ සියළුම නිළධාරීන් වෙත මුදල් රෙගුලාසි 371(2)(31) ප්‍රකාරව අත්තිකාරමක් ලබාගත් පසු එම කාර්ය අවසන්වූ වහාම පියවිය |

| | | | |
|---|---|---|---|
| | දින 162 දක්වා ප්‍රමාද කාලයක් සහිතව පියවා තිබුණි. | කළ යුතුවේ. | යුතු බවට 2019 මැයි 23 දින උපදෙස් දී ඇත. |
| (ii)මුදල් රෙගුලාසි 371(5) | සියලුම අතුරු අග්‍රිම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවියයුතු වුවත් 2001 වර්ෂයට පෙර සිට ඉදිරියට එන රු. 625,651 ක් හා 2012 හා 2018 වර්ෂ අතර කාලය තුල නොපියවූ රු.534,282 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 18 කට අධික කාලයක සිට පවතින රු.625,651 ක නොපියවූ අත්තිකාරම් ශේෂය පිළිබඳව කිසිඳු ලේඛණයක් සොයාගත නොහැකි අතර මෙම ශේෂය පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. රු.534,282 ක් වූ පියවා නොමැති අත්තිකාරම් සම්බන්ධයෙන් ලේඛණ වල ඇති ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කරමි. |
| (iii)මුදල් රෙගුලාසි 571 | 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල රු. 1,056,378 ක් වූ ආපසු නොගෙවූ තැන්පත්, විවිධ තැන්පත් හා ටෙන්ඩර් ඇප සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දින රු. 2,648,822 ක මුදලක් රාජ්‍ය ආදායමට ගෙන ඇත. තවදුරටත් තැන්පත් ලේඛනයේ පවතින තැන්පත් මුදල් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,478,780 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,853,382 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,187,000 | 4,259,303 | 3,102,285 | 1,157,018 | 3,288,000 | 2,785,317 | 2,335,381 | 449,932 |
| (ii) | කුලී | 9,041,200 | 12,339,336 | 8,574,231 | 3,765,105 | 9,627,000 | 7,737,570 | 7,563,928 | 173,642 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 610,100 | 677,460 | 677,460 | - | 535,100 | 535,100 | 535,100 | 636,517 |
| (iv) | වෙනත් ආදායම් | 72,954,800 | 66,077,240 | 45,929,762 | 20,147,480 | 18,760,000 | - | 9,420,165 | - |

2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් වසර 12 කින් දියුණු ප්‍රදේශ හඳුනාගෙන නව තක්සේරුවක් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර කැලි කසළ බැහැර කිරීමේ ගැටළුවට ස්ථිර විසඳුමක් ලැබෙන තුරු ප්‍රදේශවල වරිපනම් පැනවීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. | වරිපනම් බදු අයකළ හැකි දියුණු ප්‍රදේශ හඳුනා ගෙන නව තක්සේරුවක් කිරීමට හා කසල බැහැර කිරීමට විසඳුම් සොයා ගෙන අත්හිටුවා ඇති වරිපනම් පැනවීමට කටයුතු කළ යුතුවේ . | මේ සඳහා සුදුසු ඉඩමක් ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව මගින් අප වෙත පවරා ඇත. ඒ අනුව ඉදිරියේදී කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල හැකි නිසා ඉදිරියේදී වරිපනම් බදු අයකල හැකි ප්‍රදේශ හඳුනාගෙන නව තක්සේරුවක් කර වරිපනම් බදු අයකරන ප්‍රදේශ පුළුල් කිරීම සඳහා කටයුතු කරමි. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු වෙළඳ පොල මස්කඩ හා මාළු කඩ බදු දීමට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු5,304,688. ක හිඟ කුලී අයවිය යුතුව තිබුණි. | කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපල හිඟ කුලිය රු. 4,872,370 ක් හා පොදු වෙළඳපල නොවන හිඟ කුලිය රු.1,372,325 ක් විය. එයින් පොදු වෙළඳපල නොවන හිඟ කුලියෙන් 2018 වර්ෂයේදී රු. 284,600 ක් හා 2019 වර්ෂයේදී රු.502,517 ක් අයකර ගන්නා ලදී. පොදු වෙළඳපල කුලියෙන් රු.152,890 ක් 2019 වර්ෂයේදී අයකර ගන්නා ලදී. |

2.2.4 වෙනත් ආදායම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ---------------------------------- |
| දිනැති ගැසට් නිවේදන 22 දෙසැම්බර් 2017 දේශය තුල ට අනුව සහා බල ප්‍ර 2051 අංක පවතින සංවර්ධනය නොකල ඉඩම්වල ක බද්දක් 0.5 න වටිනාකමින් සියයටග්ධප්‍රා අයකර ගැනීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එවැනි ඉඩම් හඳුනා ගැනීමට සමීක්ෂණයක් හෝ කර නොතිබුණි. | අදාල ගැසට් නිවේදනයන් අනුව ක්‍රියා කළ යුතුවේ. | බල ප්‍රදේශයේ සංවර්ධනය නොකල ඉඩම් සඳහා 0.5% ක බද්දක් අයකර ගැසට් කර ඇතත් මෙවැනි කටයුක්තක් මේ දක්වා සිදුකර නොමැත. මේ පිළිබඳ ඉහල නිළධාරීන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ එවැනි ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් කර අයකර ගැනීමට ඉදිරි කටයුතු සිදුකරන බව සඳහන් කර සිටිමි. |

2.2.5 ප්‍රචාරණ දැන්වීම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | ---------------------------------- |
| 72 වර්ෂයේ දැන්වීම් පුවරු 2016 කට අදාලව රු 172,892.ක් අයකර ගෙන නොතිබු අතර සමාලෝචිත වර්ෂය තුලදීද වෙළඳ දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් කර තොරතුරු ලබාගෙන අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. |

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | -------------------------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 17,152,889 ක් හා රු.30,015,547 ක් විය. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 17,152,889 න් රු. 8,739,880.00 ක මුදල 2019 පෙබරවාරි 18 දින සභාවට ලැබී ඇත. ඉතිරි මුදල (2018 වර්ෂයට) ලබා ගැනිමට රත්නපුර පළාත් සභාවට ඉල්ලීම සිදු කර ඇත. පසුගිය වර්ෂ 05 කට අදාළ මුද්දර ගාස්තු ගෙන්වා ගැනිමටත් ඉතිරි වර්ෂවලට අදාළ මුද්දර ගාස්තු කපා හැරිමටත් ඉදිරියේදි කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්ය සාධනය
-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 592 හා 1990 ජනවාරි 05 දිනැති ගැසට් පත්‍රය මඟින් සම්මත අතුරු ව්‍යවස්ථා වැලඳගෙන තිබූ අතර ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 4 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 වනවිටත් අතුරු ව්‍යවස්ථාවන් 2 ක් පමණක් පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 04 න් දෙකක් 2018 අගෝස්තු 10 හා 2018 ඔක්තෝබර් 12 දින ගැසට් පත්‍රවල එලකර ඇති අතර, ඉතිරි අතුරු ව්‍යවස්ථා දෙක සකස් කර පරිවර්ථන කටයුතු සඳහා යොමුකර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැතිවීම හේතුවෙන් සේවා ලාභීන්ට මල අපහරණය කිරීමේ පහසුකම් ලබාදීමට නොහැකිවී තිබුණු අතර සභාව සතු ගලි බවුසරයද ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි . | අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට කඩිනම් පියවර ගත යුතුවේ. | මධ්‍යම පරිසර අධිකාරියේ පිලිසරු ව්‍යාපෘතිය යටතේ රු. 18,089,500ක් වැය කර ඉදල්පොල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් 2014 වර්ෂයේද ආරම්භ කර එහි දැනට කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී. නොදිරන කසළ බැහැර කිරීම සඳහා හා මළ පවාහන මළ පවාහන සඳහා සුදුසු ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මගින් සභාවට පවරා ඇත. ඉදිරියේදී නොදිරන කසල හා ගලි බැහැර කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 127 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 104 ක් වූ අතර පුරප්පාඩු 25 ක් හා අතිරික්ත 2 ක් විය. ඊට අමතරව කොන්ත්‍රාත් පදනමින් 16 ක් ද, අනියම් පදනමින් 4 ක්ද, වෙනත් බඳවා ගැනීම් 5 ක්ද විය. සභාවේ ලේකම් තනතුර සඳහා 2017 ජුනි 30 දින සිට වැඩ බැලීමේ පදනම යටතේ නිලධාරියෙකු පත්කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර අතිරික්ත සේවකයන් විධිමත් කරගත යුතුවේ. | පුරප්පාඩු 08 ක් පවතින අතර අතිරික්ත නිළධාරීන් දෙදෙනෙකු සිටී.<br>බල ප්‍රදේශය තුළ කසල කළමනාකරණය විධිමත් කිරීම සඳහා සිටින සේවකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් සෞඛ්‍ය කම්කරුවන් 16ක් ද, ආදාහනාගාර පාලක සහ ආදාහනාගාර සහායක ලෙස තනතුරු 02 ක් සේවා ගිවිසුම් මත යොදවා ගෙන ඇත. මු.රෙ.71 කට අනුව මෙම තනතුරු අනුමත කර ගැනීම සඳහා යවා ඇත. |

(ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාන මාරු වී ගිය ,විශ්‍රාම ගිය, හා සේවය හැර ගිය සේවකයින් 06 දෙනෙකුගෙන් වර්ෂ 2002 සිට 2013 දක්වා කාලයට අදාල අයවිය යුතු සේවක ණය රු. 128,956 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල සේවකයින් හය දෙනාගේ සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව සදහන් කර සිටිමි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර ලබාගෙන ඇති ආයතන 11 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කර ඇති පරිසර බලපත්‍ර ලබාගත් ව්‍යාපාරික ස්ථාන 11 න් ව්‍යාපාරික 04 ක් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකරගෙන ඇති |

| | | |
|---|---|---|
| | | අතර, ඉතිරි ව්‍යාපාර සඳහා අයකරගැනීමට කටයුතු කර ගෙන යන බව සඳහන් කරමි. |

3.3 වත්කම් කලමනාකරණය

-----------------------------

3.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ----------------------------------- |
| 2012 හා 2016 අතර කාලය තුල නිෂ්කාර්යව තිබුණ වටිනාකම රු.7,478,100 ක්වූ වාහන හා යන්ත්‍ර 11 න් වාහන 06 ක් සහ යන්ත්‍ර 3 ක් අපහරණය කරන ලෙස 2016 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණද, ලියාපදිංචි සහතික ඇතුළු නීත්‍යානුකූල ලේඛන අස්ථානගත විම හෝ වාහන සැපයූ ආයතන වලින් අයිතිය පවරා නොගැනීම හේතුවෙන් එම කටයුතු නිමකිරීමට නොහැකි වී තිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන හා යන්ත්‍ර සූත්‍ර වල ලියාපදිංචි සහතික වල මුල් පිටපත් සොයා ගැනීම සඳහා කටයුතු කරන අතර, අයිතිය පවරා ගෙන නොමැති වාහන වල අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

3.4 ප්‍රසම්පාදනය

--------------

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ----------------------------------- |
| සමාලෝචිත වර්ෂයේදී රු7,862,365.ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | සම්පාදන වර්ෂය සඳහා ප්‍ර 2019 සැලැස්ම සකස් කර එය නිසියාකාරවක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | -------------------------------------- |
| 1980 (මූල්‍ය හා පරිපාලන) රීති 168 (1) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඊලඟ වර්ෂයේ | මූල්‍ය ප්‍රකාශන | මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශනයන් සෑම වර්ෂයකම මාර්තු දිනට පෙර 31 |

| | | |
|---|---|---|
| මාර්තු 31 දින ඉදිරිපත්කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 21 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි. | නිශ්චිත කාල වකවානුවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව 2018 දෙසැම්බර් මාසයේදී එක් විගණන කළමනාකරණ රැස්වීමක් පමණක් පවත්වා තිබුණි | විගණන කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | 2019 දෙවන කාර්තුව සඳහා කළමනාකරණ කමිටුව 2019 ජූලි 12 දින පවත්වන ලද අතර, එම වාර්තාව 2019 අගෝස්තු මස ගරු මහ සභාවට ඉදිරිපත්කර ඒ අනුව කටයුතු කරමි. |

4.4 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා ලැබී තිබූ රු. 2,368,062.ක් එම කාර්යයන් ඉටුනොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි . | මේ මුදල් වලින් අදාල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රුවන්වැල්ල - ඉඹුල්ගොඩ පොදු සුසාන භූමිය අත්පත් කර ගැනීම හා මධ්‍යම පරිසර අධිකාරිය - පිළිසරු ව්‍යාපෘතියේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා තැන්පත් ලේඛනයේ ඇති මුදල් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවති. |